# ලත් මිනිසත් බවේ උතුම්ම අභිලාශය නිවන් මග විවෘත කර ගැනීමයි

**බණ්ඩාර කපුගෙදර**
විශ්‍රාමික අධ්‍යාපන අධ්‍යක්ෂ
අති. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්

ශ්‍රී සම්බුද්ධ ගෞතම බුදු පියාණන් වහන්සේ පරිනිර්වාණයට පත්ව ශතක විසිහයකට ආසන්න වෙමින් පවති. එදමෙද තුර බුදුදහම යුගයෙන් යුගය විවිධ දේශපාලනික අර්බුධයන්ට පමණක් නොව ආගමික විවිධ දෘෂ්ඩි ජාලයන්ට ගොදුරු වූ බවද නොරහසකි. හින්දු ජෛන පමණක් නොව බුදුදහම අනුගාමික ශ්‍රාවක පිරිස් තුලට විවිධ පරවාදයන් ඇතුලත්ව මායාකාරීත්වයන් ප්‍රවේශමෙන් පවති. මේ සියල්ල මත සම්බුද්ධ දර්ශනය අද බුද්ධාගම - බවට පත්වීමයි. මෙහි යුක්ති යුක්ත භාවය පිළිබඳ විවිධ තර්ක විතර්ක සමාජගත වීම සාධාරණය. ඔබ විසින් දල්වන ලද පොල්තෙල් පහන් දැල්ල දෙස බලා සිටින්න. පහන දැල්වී පවතිනුයේ ඔබ ඒ සඳහා සුදුසු පරිසරයක පහන තබා ඊට ප්‍රමාණවත් තෙල් බහාලීමෙන් භාහිර විවිධ සාධක මෙන් ම බාධක තුල දැල්වෙන පහන තෙල් නැමැති බාහිර ශක්තිය අවසන් වන විට, එකවර ආලෝක දහරාවක් නිකුත් කොට නිවී යයි. වර්ෂ දෙදහස් පන්සිය ගණනක් ඉක්මවු බුදු සමයද මේ ඉරණම හා බැඳී ඇත්දැයි විමසා බලන්න.

බුදුදහම - ත්‍රිපිටක පෙලදහම එද මෙදතුර ආරක්ෂා කරගනිමින් ශාස්ත්‍රෝද්ගහණය කරමින් පවත්වාගෙන පැමිණි ලෝකවාසි සංඝරත්නයට භක්තිපූර්වක ගෞරවය පිරිනැමිය යුතුය. ශ්‍රී ලංකා ද්වීපය - සලකනවිට, ප්‍රථමයෙන් සංඝමිත්‍ර - කුපිකකල තිස්ස වැනි ථෙරවරුන් මහාවිහාර මුලස්ථානය වූ ථෙරවාදී බුදුසමය අනුගාමික භික්ෂූන් සමඟ ගැටීමේ ප්‍රතිඵලය මහසෙන් රජු විසින් පෙළපොත් යම් ප්‍රමාණක් විනාශ කිරීමයි.

දුටුගැමුණු - වළගම්බා වැනි නරපතීන් දිවිපරදුවට තබා බුදු සසුන සුරැකීමට ගත් පියවර ප්‍රශංසනීය වේ. මෙරට බුදු සමය ස්ථාපනය වීමෙන් පසු අරිට්ඨ මහ අමාත්‍යතුමා සසුන්ගත වීමෙන් පසු මෙරට භික්ෂු සාසනය ආරම්භ විය. හෙළසෙන් බුදු දහම පළමු සියවසේ දී ලේඛානාරූඩවීම බෞද්ධ ලෝකයා ලත් විජයග්‍රහණයයි. නමුත් පස්වන සියවසේ මෙරටට ඉන්දියාවේ පතංජලීනම් හින්දු පූජකයාගේ ප්‍රධාන ගෝල භික්ෂුව වූ බුද්ධ ඝෝෂ හිමි ආගමනය - හා විසුද්ධි මග්ග හෙවත් නිවන් මග - නමින් නිවන් මග වැසූ ධර්ම ග්‍රන්ථයක් ලිවීමක් එමගින් මහා විහාර භික්ෂු අනුමැතිය ලත් බුද්ධඝෝෂ හිමි හෙළබසින් වූ පෙළදහම පාලියට පරිවර්තනය කිරීමම නිවන් මග වැසු ප්‍රථම සංසිද්ධියයි. කෙසේ මුත් තල්පත්තිරු තුලට පාලි භසින් හෝ ත්‍රිපිටක දහම ඇතුලත් කිරීමත් පිරිවෙන පාදක මෙරට අධ්‍යාපනය කේ‍්‍රන්ද්‍රස්ථාන මගින් භික්ෂුන් වහන්සේ ඇසුරෙන් හෝ දහම මෙතෙක් පවත්වා ගැනීමේදී මහෝපකාරී විය.

දහම් ගවේෂි ඔබකරා යොමු වූ පහන් දැල්ල මහා ආලෝක වී නිවියන සංසිද්ධිය සෙයින් වර්තමානයේ සෘජුව හා විවිධ සංනිවේදන ජාල තුලින් බුදු දහම ලෝකය පුරා විසිරී ඇති බොදුජනතාවට පමණක් නොව සෙසු ප්‍රජාව වෙත ද සමාජගත වීම දක්නට හැක. අර්හත් උතුමන් යළි ශ්‍රී ලංකාද්වීපය ආශ්‍රිතව බිහිවෙමින් පැවැතීම පහන නිවීමට ප්‍රථම ප්‍රභාෂ්වර ආලෝකමත් නිකුත්වීම බඳුය. ජීවමාන බුදුපියාණන් වෙතින් සුභද්‍රද නම් පිරිවැජියා විසින් ඔබ වහන්සේ ගේ පරිනිර්වානයෙන් ලොව අරහතුන් වහන්සේලා බිහිනොවේදැයි - විමසු විට - ඉමේච සුභද්ද භික්‍ෂු සම්මා විහරෙය්‍යසුං නසුඤ්ඤො ලෝක අරහන්තෙය්‍යුං - සතිමත් යහපැවැත්මෙන් යුතු භික්ෂූන් සිටින තාක් ලෝකයේ අරිහතුන් වහන්සේලාගෙන් ශූන්‍ය නොවේ යයි වදලහ.

බුදුදහමට අනුව සංඝාර භයං ඉක්ඛතීති භික්ෂු සසර සිය දැනුන සියල්ල භික්ෂූන් සේ පිළිගතහොත් සිව්වනක් පිරිසම මේ ගණයට වැටේ. කෙසේ මුත් බොදු ප්‍රජාවගේ අවධානයට යොමුවිය යුතු බුද්ධ අවවාදයක් බුද්ධක නිකායේ මල වග්ගයේ

තතො මලං මලතරං - අවිජ්ජා පරමං මලං
එවං මලං පහත්වාන - නිමමලා හොථ භිකබවේ

බැඳී ඇති ලොකුම ''මල'' හෙවත් කෙලෙස් නම් අවිද්‍යාව බවය. සොබාදහමේ ප්‍රකෘතිය පිළිබඳ අනවබෝධයයි. මෙම කෙලෙස් මලය - ඉවත් කොට පිරිසිදු වන්න'' යි අවවාදයයි. සමස්ත සම්මුතියට අවිද්‍යාව යයිද සම්බුදුන් වසර 45ක් මුළුල්ලේම දේශනා කළේ මෙම අවිද්‍යාව හෙවත් මිථ්‍යා දෘෂ්ටියෙන් මිදී විද්‍යාව තමා තුලින් පහළකර සම්මා දිට්ඨියට පතවීමේ පරමාර්ථ ධර්මයයි. දහම් අවබෝධය ගිහි පැවිදි සියළුම උතුමන් හට විවෘතය. ''ධමෙමා විවමො විරොචක් නපටිචජ්ජෙනා -වැසී ඇති දහම විවෘතවූ විට බබළන බැව් දක්වා ඇත. දහම තුළින් නිර්වාණ සුවය සාක්ෂාත් කරනු ලබන පුද්ගලයා අනුක්‍රමික පියවර 03ක් අනුගමනය කළ යුතුය. එනම් දහම් න්‍යාය ප්‍රථමයෙන් අධ්‍යධනය කළ යුතුය. එය පධ්‍යාප්ති නමින් හදුනා ගැනේ. දහම මැනවින් ප්‍රථමයෙන් දැනගත් ආර්ය්‍ය පුද්ගලයා දෙවැනි පටිපත්යෙහි එනම් අදාල ප්‍රතිපත්ති හෙවත් නිවන් මග පූර්ණය උදෙසා එලඹි සිහියෙන් යුතුව ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. එවිට අනපේක්ෂිත ලෙස පටිවේද හෙවත් නිර්වාණ දහම අවබෝධයට පත්වේ.

ලොව සියළු ආගම් ගුප්ත වූ භක්ති පූර්වක විශ්වාසය මත රදා පවතී. එහෙත් සම්බුදු දහම, නිදහස් සම චින්තනයට විවෘතය. බුදුහු කුරුරට - වර්තමාන නවදිල්ලියේ වැසියනට කාලාම සූත්‍රයේ දහම් දෙසමින් ප්‍රකාශ කළේ, මා පරම්පරාය, මා ඉතිකිරාය, මා පිටක සම්බදනෙන මා හේතු ........ ආදී වශයෙන් උගත් පඬිවරයකු රහතන් වහනසේ හෝ තථාගතයන් වහනසේ හෝ දේශනා කරන නිසාම පිළිනොගන්නා ලෙසත් තම බුද්ධියට විචාරයට විමසීමට ලක්කොට පිළිගන්නා ලෙසයි.

41 වන පිටට

